# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය

SINHALA

*India's National Spiritual Newspaper*

₹ 10/-

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAANS

**Editor : S. SAM SELVA RAJ**

**16 Languages**

Vol. XIII　　YEAR OF OUR LORD JESUS CHRIST, MAY 2019　　Issue No. 9

## ශුද්ධවූ බයිබලය (හිතෝපදේශ 14:1-10)

01. ඥානවන්ත ස්ත්‍රී තෙමෝ තම ගෙය ගෝඩනගන්නීය, එහෙත් අඥාන තැනැත්තී තමාගේම අත්වලින් ඒක කඩාදමයි.
02. තමාගේ සෘජුකමෙන් හැසිරෙන්නා ස්වාමීන්වහන්සේ කෙරෙහි භයවන්නේය, එහෙත් වංක මාර්ග ඇත්තා උන්වහන්සේ සුළුකොට සලකන්නේය.
03. මෝඩයාගේ මුඛයෙහි උඩඟුකම නැමැති ඉපලක් ඇත්තේය, එහෙත් ප්‍රඥාවන්තයන්ගේ තොල් ඔවුන් ආරක්ෂා කරයි.
04. ගවයන් නැති ගාල පවිත්‍රය, එහෙත් ගොනාගේ ශක්තියෙන් බොහෝ අස්වැන්න ලැබේ.
05. විශ්වාස සාක්ෂිකාරයෙක් බොරු නොකියයි, එහෙත් බොරු සාක්ෂිකාරයා බොරු නික්මෙයි.
06. නින්දාකරන්නා ප්‍රඥාව සොයන නුමුත් එය සම්භ නොවන්නේය.
07. අඥානයා ඉදිරියට යන්න. එවිට ඔහුට දැනගැනීමේ තොල් නැති බව නුඹට පෙනෙන්නේය.
08. බුද්ධිමත් අයගේ ප්‍රඥාව නම් තමාගේ මාර්ගය තේරුම්ගැනීමය, එහෙත් අඥායනයන්ගේ මෝඩකම වංචාවය.
09. මෝඩයෝ වරද ගැන සරදම්කෙරෙති. එහෙත් අවංකයන් අතරේ දේව කරුණාව ඇත්තේය.
10. සිත තමාගේම ශෝකය දනියි, එහි ප්‍රීතියට අන්‍යයෙක් මැදි නොවෙයි.

# මහත් රහසක්

***''මේ රහස මහත්ය. නමුත් මම ක්‍රිස්තුස්වහන්සේ ගැනත් සභාව ගැනත් කථා කරමි.'' (එපීස 5:32)***

දෙවියන්වහන්සේගේ සභාව ලෝකයෙහි තබා තිබෙන්නේ දෙවියන්වහන්සේගේ ස්වර්ගීය බලතල මේ පොළොවෙහි ක්‍රියාත්මක කරන පිණිසය. සභාව යනු ශුද්ධවන්තයින්ගේ සමභාගීකමයි ක්‍රියා පොතෙහි පළමු පරිච්ඡේද 10 හි සඳහන්ව ඇත. ක්‍රිස්තුස්වහන්සේ සමඟ ජීවත් වෙන්නාවූ උන්වහන්සේගේ ප්‍රේමයේ රස වින්ඳාවූ අපෝස්තුළුවරුන්ට දුන් නාමය නම්, 'ගෝලයන්' වේ. පසුව මෙම ගෝලයින්ව 'ක්‍රිස්තියානි' *(ක්‍රියා 11:26)* යන නමින් හැඳින්විය. මේ අය සමඟ අනෙක් අය එකතු වුනේ නැත. *(ක්‍රියා 5:13)*

සැබෑ කිතුණුවන් බොරු කියන්නේ නැත. ඔවුන් දෙවියන්වහන්සේට භයෙන් යුතුව හැසිරෙන්නේය. සමහරු ඔබව පාවා දෙනවා නම්, ඔවුන් දෙවියන්වහන්සේගේ දරුවෝ නොවෙන්නේය. ඔබට විවෘත මනසකින් යුතුව ඔවුන් සමඟ කථා කල හැකිය. ක්‍රිස්තුස්වහන්සේගේ ආකෘතිය අනුව ගමන්කරන්නෝ උන්වහන්සේගේ අඩිපාරේ ගමන්කරන්නාවූ අය දෙවියන්වහන්සේගේ දරුවෝය. ඔවුන් තමාගේ ජීවිතයේ සියලුම අවස්ථා වලදී ක්‍රිස්තුස්වහන්සේව පාවා නොදී ඔවුන් ප්‍රශ්න හා කරදර වලදී ක්‍රිස්තුස්වහන්සේ උදෙසාම ජීවත් වේ.

දෙවියන්වහන්සේටත් සභාවටත් තිබෙන්නාවූ සම්බන්ධතාවය මහත් රහසකි. ස්වර්ගයේ තිබෙන්නාවූ රහස ස්වාමීන්වහන්සේගේ ඇදහිලිවන්තයා කරණකොටගෙන සභාව තුල ප්‍රකාශ වෙයි. දෙවියන්වහන්සේ තුලින් උපාධිය ලැබූ අය දෙවියන්වහන්සේගේ දරුවෝය. ක්‍රිස්තුස්වහන්සේ තුල විශ්වාස කරන්නෝ උන්වහන්සේගේ උපාධිය ලබා තිබේ. *(යොහාන් 1:13)*

*3 වෙනි පිටුවට ...*

*Touching lives by Teaching ....... Since 1969*

# කැඳවීමේ ප්‍රතිරාවය

**"ඉඳින් නුඹේ පියවූ දාවිත් හැසුරුනාක්මෙන් නුඹ මාගේ පනත්ද ආඥාද රක්ෂා කරමින් මාගේ මාර්ග වල හැසිරෙන්නෙහි නම් නුඹේ දවස් ද වැඩි කරන්නෙමි."**
**(1 රාජාවලිය 3:14)**






**ප්‍රිය මිත්‍රවරුනි,**

**අපගේ ගැලවුම්කාර මළවුන්ගෙන් උත්ථාන වූ ස්වාමි යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පුදුම වූ නාමයෙන් ඔබට සුභ පැතුම් ගෙනෙමි. අප ඔබගේ ආරක්ෂාව උදෙසා යාච්ඤා කරමි. ස්වාමි වූ යේසුස්වහන්සේගේ උන්වහන්සේගේ මළවුන්ගෙන් නැගිටි බලය කරණකොට ගෙන ඔබගේ ජීවිතයට බලවත් සේ උපකාර කරන සේක.**

ඉන්දියාවේ සියලුම සභාවල හා සංවිධානවල මැයි මාසයේදී නිවාඩු කාලීන බයිබල් පාසල ළමුන් උදෙසා පවත්වයි. මේ තරුණ පරම්පරාවට දේවවචනය උගන්වමින් ඔවුන්ට හරි මාර්ගය පෙන්වනඅයට උපකර කරන්නය කියා යාච්ඤා කරන්න.

**අපගේ වැඩ සටහන්**

**අප්‍රේල් 20** - ප්‍රධාන සභාවේ නිරාහාර යාච්ඤාව නිවාඩු කාලීන බයිබල් පාසල වෙනුවෙන් නිරාහාර යාච්ඤාව

**අප්‍රේල් 24,27** - සංදෝෂපුරම් සභාවේ නිවාඩුකාලීන බයිබල් පාසල

**අප්‍රේල් 29 මැයි 4** - වේලච්චේරි සහ බාලාජීනගර් සභාවේ නිවාඩුකාලීන බයිබල් පාසල

**මැයි 6 - 12** - ප්‍රධාන සභාවේ නිවාඩු කාලීන බයිබල් පාසල

ළමුන් උදෙසා පවත්වන්නාවූ මෙම වැඩසටහන් උදෙසා ඔබගේ යාච්ඤාව අපි අගය කරමු. මෙම සගරාව ඔබගේ අතට ලැබෙන විට ඉන්දියාවේ මහ මැතිවරණය අවසන් වී නව මැති ඇමතිවරු පත්වී සිටින අලුත් ආණ්ඩුවක් පත්ව ඇති නිසා ඒ නිලධාරි මණ්ඩලයට ආශිර්වාදය ඉල්ලා අපි යාච්ඤා කරමු.

මේ දිනවලදී බොහෝ අයගේ පවුල් ප්‍රශ්න ගැනත් ලෙඩ රෝග ගැනත් යාච්ඤා කරන්නය කියා ඉල්ලීම් රාශියක් අපට ලැබී තිබේ. එබැවින් මේ අයගේ සුවය උදෙසා යාච්ඤා කරමු. මේ අපගේ දුතයන් එවා ඔවුන්ව ආරක්ෂා කරනවා ඇත.

ලෝකයේ සැම රටකටම දෙවියන්වහන්සේගේ සමාදානය දෙන්නය කියා අපි යාච්ඤා කරමු. මේ කාරණය නිසා සෑමදාම උදෑසන 5.30 6.30 දක්වා ප්‍රධාන සභාවේ අපි යාච්ඤා පවත්වමු.

අපගේ බයිබල් විදුහල ජූනි මස 3 වන දින නැවත ආරම්භ කරමු. මේ නව වසරට කැපවූ ශිෂ්‍ය ශිෂ්‍යාවන් ලබාදෙන්නය කියා යාච්ඤා කරන්න.

දේව රාජ්‍ය දෙවියන්වහන්සේ විසින් ව්‍යාප්ත කරමින් සිටින්නාවූ මේ කාලයේදී සියලුම අමාරුකම් උන්වහන්සේම සපයා දෙන්නය කියා අප වෙනුවෙන් විශේෂයෙන්ම යාච්ඤා කරන්න. ස්වාමින්වහන්සේගේ ආශිර්වාදය ඔබ සමග වේවා.

**ක්‍රිස්තුස්වහන්සේ තුළ ඔබගේ සේවක,**
**එස්. සෑම් සෙල්ව රාජ්**


**CHIEF EDITORS**
Pastor S. Sam Selva Raj
Angeline Selvakumari Henry, M.A., M.Ed.
**MANAGING EDITOR**
Pastor Alex Samson Sam, B.Th., M.Div.
**ADMINISTRATION**
Bro. N. Prakasam, M.A., General Manager
**EDITORIAL BOARD**
Sis. Jesy Veena Sam
Bro. M. Paulraj, M.A., B.Ed.
Sis. Serena Bevin, M.A., M. Phil., B.Ed.
**ADVISORY BOARD**
Adv. Jose Abraham
Adv. N. Balaji, B.Com., B.L.
Dr. S. Rabinder Boaz, M.S.
Er. C.G.S. Baburao, B.Tech., M.Tech. (DM)
Aud. K. Puratchivendan, M.Com., B.L.
Bro. Rajeswaran Samuel, B.Com.



**PUBLISHER & PRINTER**
Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
**Phone :** (+91-44) 2852 8282
2852 9293, 2854 7766
**Email :** sam@echoofhiscall.org
biblecor@yahoo.co.in
**Websites :**
www.echoofhiscall.org
www.echoofhiscall.com



**Our Ministries:** ECHO OF HIS CALL Monthly Magazines (16 languages) BIBLECOR - Postal Courses (3 languages) Theological Correspondence Courses (2 languages) Church Planting Nehemiah Bible Colleges Gospel Printing Press Great Commission Partners Village English High School Crusades 24 Hour Prayer Ministry Community Development

***1 පිටුවෙන්....***

මනුෂ්‍යයෙක් මේ ලෝකයේ ජයග්‍රාහී ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය කරන සියලුම සත්‍යතාවයන් සභාවටත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේටත් අතර තිබෙන සම්බන්ධතාවය කරණකොටගෙන රඳා පවතී. නමුත් අද මනුෂ්‍යයන් ඔවුන්ගේ ජීවිතයේ දියුණුව සඳහාත් ප්‍රීතිය හා සමාදානය සඳහාත් මේ සත්‍යතාවය අහකට දමා විවිධාකාර මාර්ගයන් තෝරාගෙන ඇත. ශුද්ධවූ බයිබලයේ බොහෝ රහස් තිබේ. නමුත් ක්‍රිස්තුස්වහන්සේටත් සභාවටත් අතර තිබෙන රහස තේරුම්ගෙන ඒ සම්බන්ධතාවය තුල අප ජීවත් වෙනවා නම් ජීවිතයේ මහත් වෙනසක් ඇතිවෙනවා ඇත.

සංස්කෘතියටවත් නවීන ක්‍රම හා විධි වලටවත් ලෝකයේ ගැලවුම්කරුවාණන් වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සභාව වෙනස් කිරීමට නොහැකිය. ක්‍රිස්තුස්වහන්සේ ගැන පැහැදිලි අවබෝධයක් නැති අය අද ක්‍රිස්තුස්වහන්සේව ප්‍රතික්ෂේප කරන්නේය. ක්‍රිස්තුස්වහන්සේව විශ්වාසයෙන් අනුගමනය කරන්නාවූ කවුරුන්ව හෝ දෙවියන්වහන්සේව අමතක කර ඇතිද? කවුරුන් හෝ දුප්පත් වී සිටීද?
මේ අය තවත් අයට කරදර කරනවාද? කිසිවෙකුට මේ ප්‍රශ්න වලට 'ඔව්' කීමට නොහැකිය.
***''මම යෞවනව සිටිමි, දැන් මහළුව සිටිමි, එසේවී නමුත් ධර්මිෂ්ඨයා අත්හරිනු ලැබූ බවත්..නුදුටිමි.'' (ගීතාවලිය 37:25)*** යේසුස් ක්‍රිස්තුස්වහන්සේව අනුගමනය කලාවූ කෙනෙක් කැම වේලකට හිඟා කෑ ආකාරය මා දුටුවේ නැත.

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ උපත හා අළුත් අවුරුද්ද කිතුණුවෝ පමණක් නොව ලෝකයේ සිටින සියලුම ආගමික සෙනඟද පොදුවේ මෙය සමරනු ලබයි. ජනවාරි මස පළමුවෙනි දින බොහෝ උත්සව හා බොහෝ ආගමික පූජාවන් සියලු ආගමික ස්ථානවල සිදු කරනු ලබති. මේවා මෙලෙස සිදු කරන්නේ ඇයි? මන්ද සත්‍ය සත්‍යයයි. සත්‍ය වූ දේ දිගු කාලයක් පුරා සඟවා තැබිය නොහැක. ලෝක ඉතිහාසය දෙකට වෙන්කර ඇත්තේ ක්‍රිස්තුස්වහන්සේගේ උපතයි. එනම් ක්‍රිස්තු පූර්ව (ක්‍රි. පූ) හා ක්‍රිස්තු වර්ෂ (ක්‍රි. ව) කියාය. ලෝකය නොමග ගිය වේලාවේදී අහස හා පොළොව මැවූ දෙවියන්වහන්සේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නමින් මනුෂ්‍ය පුත්‍රයෙකු ලෙස මේ ලෝකයට එළිදරව් වෙමින් උන්වහන්සේගේ උපත, මරණය හා මළවුන්ගෙන් නැගිටීමේ ඒ, ප්‍රේමය අපට පෙන්නුවේය. (රෝම 5:8) මේ මිහිතලය තුල මිය ගියාවූ සෑම කෙනාගේම සොහොන් වසා තිබෙන මොහොතක යේසුස්වහන්සේගේ සොහොන පමණක් විවෘතව හිස්ව තිබෙන්නේ ඇයි? මන්ද උන්වහන්සේ ලෝකයේ ගැලවුම්කාරයාණෝය.
මරණයෙන් ජය ගත්තාවූ ස්වාමීන්වහන්සේය. ඕනෑම කෙනෙකුට ක්‍රිස්තුස්වහන්සේගේ සභාවට බලපෑමක් ඇති කිරීමට හැකිමුත් දෙවියන්වහන්සේගේ සභාව තිබෙන්නේ මනුෂ්‍ය පාලනයේ නොව එය දෙවියන්වහන්සේගේ පාලනයෙන් ක්‍රියාත්මක වෙන්නාවූ සභාවකි. ඉතිහාසයේදී සභාවන් පාලනය කිරීමට, නැති කිරීමට වෑයම් කල අය ගැන අපි අසා ඇත. නමුත් ඔවුන් සියල්ලෝම නැතිවී ගොස් තිබේ. එම නිසා මෙම ශුභාරංචිය ප්‍රඥාවන්ත ලෙස අප ප්‍රකාශ කිරීමට අවශ්‍යයි. දෙවියන්වහන්සේගේ මහිමය ගැන නොදන්නාවූ අය ස්වාමීන්වහන්සේගේ දැන ගැනීම දැනගත යුතුය. එවිට ඔවුන් දේව සමාදානය ලැබේ. අද පවා සියල්ලෝම පිළිගන්නාවූ සත්‍ය නම් ක්‍රිස්තුස්වහන්සේගේ සභාව ලෝකයේ බොහෝ රටවල දිනපතා ස්ථාපිත වෙමින් පවතින බවයි.

### (1). මගේ සභාව ගොඩනගමි.

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පිලිප්පියේ කායිසාරියට පැමිණි විට උන්වහන්සේගේ ගෝලයින්ගෙන් මෙසේ අසනු ලැබීය. ''මනුෂ්‍ය පුත්‍රයා කවරෙක්ය කියා මනුෂ්‍යයෝ කියද්ද?'' කියා ඇසුවේය. සමහරෙක් ඔබ යොහාන් බෞතීස්තය කියාද අන් සමහරෙක් එළියාය කියාද, තවත් අය, යෙරෙමියා නොහොත් අනාගතවක්තෘන්ගෙන් එක්කෙනෙක්ය කියාද පවසයි කියා ගෝලයින් පවසනු ලැබීය. නමුත් යේසුස්වහන්සේ, ''නුඹලා මා කවුරුය කියා කියනවාදැයි'' ඔවුන්ගෙන් ඇසීය. එවිට සීමොන් පේත්‍රුස් උත්තර දෙමින් ''ඔබ ක්‍රිස්තුස්වහන්සේය, ජීවමාන දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෝයයි'' කීවේය. යේසුස්වහන්සේ ඔවුන්ට උත්තර දෙමින්, ***''සීමොන් බර්-යෝනා නුඹ ආශිර්වාදලද්දෙක්ය. මක්නිසාද ස්වර්ගයෙහි සිටින මාගේ පියාණන්වහන්සේ මිස මාංසය හා රුධිරය***

***මේක නුඹට එළිදරව් නොකෙළේය. මම නුඹට කියමි, නුඹ පේත්‍රුස්ය. තවද මේ පර්වතය පිට මාගේ සභාව ගොඩනගන්නෙමි, පාතාලයේ දොරටු ඒක පරාජය නොකරන්නේය. (මතෙව් 16:17-18)***

අපගේ ස්වාමීන්වහන්සේ සීමොන්ගෙන් අසනු ලැබුවේ, අනෙක් අය උන්වහන්සේ ගැන පවසන්නේ මොනවාද? කියාය. මන්ද සෙනඟ උන්වහන්සේ ගැන පවසන්නේ මොනවාදැයි කියා දැනගැනීමට උන්වහන්සේ කැමති විය. මෙයින් අදහස් වන්නේ සෑම නායකයෙක්ම සෙනඟ ඔවුන් ගැන කථා කරන්නේ මොනවාද කියා දැනගන්නට ඕනිය කියා මිනිසුන් මා ගැන මොනවා පැවසුවත් මට කමක් නැහැ කියාත් මා මගේ හෘද සාක්ෂියට එකඟව වැඩ කරනවාය කියාත් අපට පැවසීමට නොහැකිය. මෙහිදී යේසුස්වහන්සේ පේත්‍රුස්ගෙන් අසනු ලැබුවේ අනෙක් අය මා ගැන පවසන්නේ මොනවාද කියාය. සීමොන් එයට පිළිතුරු දුන්නේ, 'ඔබ ක්‍රිස්තුස්වහන්සේය, ජීවමාන දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝය.' පේත්‍රුස් මෙහිදී කථා කරනු ලැබුයේ ඔහුට ලැබුණු එළිදරව් කරණකොට ගෙනය. යේසුස්වහන්සේ ඔහුට පවසනු ලැබුයේ, 'මාංසයෙත් රුධිරයෙත් මෙය ඔබට එළිදරව් නොකලේය, ස්වර්ගයේ සිටින්නාවූ පියාණන් වහන්සේම ඔබට මෙය එළිදරව් කරන ලද්දේය.' කියාය. අද ලෝකයේ මිනිසුන් කිතුණුවන්ට ගණන්ගනු ලබන්නේ මෝඩයෝ, අඥානයෝ, ආගම් පතුරුවන්නෝ යන විවිධ නම් වලිනි. නමුත් ඔවුන් යේසුස්වහන්සේව පිළිගත් විටදී ඔවුන්ට ස්වර්ගීය දර්ශණයක්, ස්වර්ගීය අවබෝධයක් දේව දරුවන් ගැන ලැබේ.

යේසුස් ක්‍රිස්තුස්වහන්සේව පිළිගත් අප සියලු දෙනාම ස්වාමීන්වහන්සේගෙන් එළිදරව්වක් ලබාගත්තාවූ සෙනඟකි. ඔවුන් ඔවුන්ගේ අතීතය කරණකොටගෙන ජීවත් නොවී ක්‍රිස්තුස්වහන්සේගේ එළිදරව්ව කරණකොටගෙන ජීවත් වූ අයයි.

'දෙවියන්වහන්සේ මට කථා කලේ නැහැ. මට උන්වහන්සේගේ හඬ ඇසුනේ නැහැ.' කියා ඔබට කීමට බැරිය. මන්ද පේත්‍රුස්ට දෙවියන්වහන්සේ පවසනු ලැබුයේ, නොව 'මෙය ඔබට එළිදරව්' කරනු ලැබුයේ මාංසය හා රුධිරය නොව ස්වර්ගයේ පියාණන්වහන්සේම මෙය එළිදරව් කළාය' කියාය. එනම්, ඔබ ක්‍රිස්තුස්වහන්සේව පිළිගත් කෙනෙක් නම්, අනිවාර්යයෙන්ම ක්‍රිස්තුස්වහන්සේ ඔබට එළිදරව්වක් දෙනු ඇත. ඒ එළිදරව්ව කරණකොටගෙන ඒ දෙවියන්වහන්සේගේ හඬ ඔබට ඇසෙනු ඇත. ඔබට මේ ලෝකාකාරයෙන් තොර වෙනස්වූ ජීවිතයක් ගත කිරීමට හැකිය.

ක්‍රිස්තුස්වහන්සේගෙන් එළිදරව්වක් ලබාගත් සෑම කෙනෙක්ම සාර්ථකත්වයට පත් වෙති. උන්වහන්සේ, උන්වහන්සේගේ දරුවන්ට උගන්වමින් නිසි මාර්ගයක ඔවුන්ව ගෙන යනු ඇත. ඒ ආකාරයට දේව කැමැත්ත තුල එළිදරව්වක් ලබා ගෙන උන්වහන්සේගේ දරුවෙක්ව සිටි උන්වහන්සේගේ සභාව ගොඩනගන්න.

**(2). මාගේ සභාව**

ඕනෑම කෙනෙක්ට ඕනෑම වැඩක් මේ ලෝකය තුල කිරීමට හැකිය. නමුත් සභාවක් ගොඩනගනු ලබන්නේ ස්වාමීන්වහන්සේගේ දැතෙනි. ***මතෙව් 16:18 හි 'මාගේ සභාව මා ගොඩනගමි'*** යි කියා යේසුස්වහන්සේ පවසනු ලැබීය. එනම්, පේත්‍රුස් හා පාවුල් සභාව ගොඩනගයි කියා උන්වහන්සේ පැවසුවේ නැත. 'පාතාලයේ දොරටු එයට විරුද්ධව පැමිණෙයි කියා' උන්වහන්සේ පවසනු ලැබීය.

දෙවියන්වහන්සේගේ සෙනඟ රැස්වෙන්නාවූ ස්ථානය සභාවයි. එනම්, සභාවක් යනු ගොඩනැගිල්ලක් නොවේය. දෙවියන් වහන්සේගේ සෙනඟ රැස්වෙන්නාවූ ස්ථානය සභාවයි. අප සියලුදෙනා දෙවියන්වහන්සේගේ නාමයෙන් යම් කිසි ස්ථානයක රැස්වෙන්නේද එය දෙවියන්වහන්සේගේ සභාවයි.

දෙවියන්වහන්සේගේ සෙනඟව දෙවියන් වහන්සේ ගොඩනංවයි. උන්වහන්සේගේ පොරොන්දුව නම් උන්වහන්සේගේ දරුවන්ට විරුද්ධව පාතාලයේ දොරටු බලපාන්නේ නැති බවයි. මෙය ඔබ පිළිගන්නවා නම්, ඔබ සභාව රැස්වෙන්නාවූ ස්ථානයට යා යුතුයි. එවිට උන්වහන්සේ අපව ගොඩනංවමින් අපව දියුණු කරයි. පතාලයට අයිති දේ බල රහිත වෙයි. ඔබගේ ප්‍රශ්න ඔබගේ කරදර සියල්ල දැක ඒ සෑම දේ තුලින්ම සභාව කරණකොටගෙන උන්වහන්සේ ඔබව ආත්මිකව ගොඩනංවයි. ලෙඩරෝග, කරදර, ණය, දිළිඳුකම, යක්ෂයා විසින් ගෙනෙන්නාවූ සෑම දේම ඔබට විරුද්ධව

6 වෙනි පිටුවට...

GREAT COMMISSION PARTNERS
ECHO OF HIS CALL MINISTRIES
SINCE 1969

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

බෙදා ගැනීම (ගලාති 6:2)
උපකාර කිරීම (රෝම 12:13) සහ
පුබුදු කිරීම (2 තිමෝති 1:6)

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**මැයි: 19-** දේව රාජ්‍යය තුල සෑම ධර්මිෂ්ඨ ක්‍රියාවන් ගැනම යාච්ඤා කරන්න.

**මැයි: 20-** දේව රාජ්‍යය තුල දෙවිඳුන්ගේ .... සැපයීම ගැන ස්තුති කරන්න.

**මැයි: 21-** දේව රාජ්‍යය තුල භාෂා 16 කින් මුද්‍රණය වන "කැඳවීමේ ප්‍රතිරාවය" පුවත්පත ගැන ස්තුති කරන්න.

**මැයි: 22**- දේව රාජ්‍යය තුල මැදහත් යාච්ඤාව තුලින් සම්බන්ධ වී සිටින අය ගැන ස්තුති කරන්න.

**මැයි: 23**- දේව රාජ්‍යය තුල ළමා සේවය ගැන ස්තුති කරන්න.

**මැයි: 24**- දේව රාජ්‍යය තුල හුදෙකලා ප්‍රදේශවල සේවයේ යෙදී සිටින අය ගැන ස්තුති කරන්න.

**මැයි: 25**- දේව රාජ්‍යයේ තුල සිදුකරන දේවධර්මාදු තුල පාඩම් මාලා ගැන ස්තුති කරන්න.

**මැයි: 26** - දේව රාජ්‍යයේ තුල කාන්තා සේවය ගැන ස්තුති කරන්න.

**මැයි: 27**- දේව රාජ්‍යයේ තුල සියලුම බයිබල් විදුහල් අධ්‍යනයන් ගැන ස්තුති කරන්න.

**මැයි: 28**- දේව රාජ්‍යය තුල තරුණ සේවය ගැන ස්තුති කරන්න.

**මැයි: 29**- දේව රාජ්‍යය තුල දිව්‍යමය සුවය ලබාගත් අප ගැන ස්තුති කරන්න.

**මැයි: 30**- දේව රාජ්‍යය තුල කැපවීමෙන් සේවය කරන සැවොම ගැන ස්තුති කරන්න.

**2019 ජූනි මාසය**

**ජූනි: 01-** දේව රාජ්‍යය තුලින් පසුගිය මාසය පුරා ඔබ ලැබූ ආශිර්වාද ගැන ස්තුති කරන්න.

**ජූනි: 02-** දේව රාජ්‍යය තුල පාලක සෑම් සෙල්වරාජ් ඇතුලු පවුල් සෑම කරන සේවයට දෙවිඳුන්ගේ ලැබුන ආශිර්වාද ගැන ස්තුති කරන්න.

**ජූනි: 03-** දේව රාජ්‍යය තුල ශ්‍රී ලංකා බයිබල් සමාගම සිදුකල අනර්ඝ කාර්ය භාරය ගැන ස්තුති කරන්න.

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**ජූනි: 04-** කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ මූල්‍යමය අවශ්‍යතා ගැන යාච්ඤා කරන්න.

**ජූනි: 05-** යාච්ඤා මැදිහත්කරුවන්ගේ සේවය ගැන යාච්ඤා කරන්න.

**ජූනි: 06-** 2 ලේකම් 7/14 ට අනුව දේශයේ සුවය ගැන යාච්ඤා කරන්න.

**ජූනි: 07-** සෑම දේව සේවකයෙකු මතම නැවුම් ආලේපයක් පතිත වන ලෙස යාච්ඤා කරන්න.

**ජූනි: 08-** රූපවාහිනිය තුලින් දේශනා කරන කිතුණු දේශකයන් ගැන යාච්ඤා කරන්න.

**ජූනි: 09-** සෑම දේව දරුවෙක්ම දේව ප්‍රේමයෙන් පිරෙන පිණිස යාච්ඤා කරන්න.

**ජූනි: 10-** හිරකරුවන්ගේ ගැලවීම උදෙසා යාච්ඤා කරන්න.

**ජූනි: 11-** ත්‍රස්තවාදය ලෝකයෙන්ම තුරන් වන පිණිස යාච්ඤා කරන්න.

**ජූනි: 12-** සෑම කිතුණු නිවසක්ම දෙවිඳුන්ගේ සේවය පිණිස මධ්‍යස්ථානයක් වන ලෙස යාච්ඤා කරන්න.

**ජූනි: 13-** මත් ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූ අය ඉන් නිදහස් වන පිණිස යාච්ඤා කරන්න.

**ජූනි: 14-** පාලක සෑම් සෙල්ව රාජ්ට ශ්‍රී ලංකා සංචාරයක් උදෙසා පැමිණීමට හැකි වන පිණිස යාච්ඤා කරන්න.

**ජූනි: 15-** වැඩිහිටි නිවාසවල ජීවත් වන අය උදෙසා යාච්ඤා කරන්න.

**ජූනි: 16-** දේශයේ දේශපාලන නායකයන් උදෙසා යාච්ඤා කරන්න.

**ජූනි: 17-** ගොවි ජනතාව ගැන යාච්ඤා කරන්න.

**ජූනි: 18-** ඔබට වැරද කල අයට සමාව දෙමින් යාච්ඤා කරන්න.

4 පිටවෙන්

ක්‍රියා කිරීමට නොහැකි ඒවා බල රහිත වෙනු ඇත. ඔබ උන්වහන්සේගේ සභාවට අයිති කෙනෙක් නිසා ඔබට එළිදරව්ව ලැබී තිබෙන්නේ මාංසයෙන් හා රුධිරයෙන් නොව එය ලැබී තිබෙන්නේ දෙවියන්වහන්සේගෙනි. දේව වචනය අනුව ක්‍රියා කරමින් තමාගේ ජීවිතය ආත්මික ලෙස ගොඩනගා ගන්නන්ව උන්වහන්සේ පර්වතය මත තමාගේ නිවස සෑදූ මනුෂ්‍යයෙකුට සමාන කරයි. වැලි මත තම නිවස ගොඩනැගූ මනුෂ්‍යාගේ නිවස වර්ෂාව හා කුණාටු පැමිණි විට විනාශ වී යයි. නමුත් පර්වතය මත තම නිවස සෑදූ මනුෂ්‍යාගේ නිවසට මහත් වර්ෂාවක් හා සුළඟක් පැමිණුනත් ජලගැල්මක් ආවත් ඔහුගේ නිවස ස්ථිරව තිබේ. මොනතරම් පරාජයන් හා අමාරුකම් ආවත් ඔහු ස්ථිරව සිටී. මන්ද ඔහු ක්‍රිස්තුස්වහන්සේගේ සභාවයි. ඔහු උන්වහන්සේ තුල තම ජීවිතය ගොඩනගා තිබෙන නිසා මෙවැනි බාධා මෙවැනි පාතාලයේ ක්‍රියාවන් පැමිණුනත් ඔහුට විරුද්ධව ඒවා ජය නොගනු ඇත. ඔබත් එවැනි කෙනෙක් නම්, ඔබ පර්වතයක් මත තමාගේ නිවස සෑදුවාවූ මනුෂ්‍යයෙකුට සමානය.

අප ජයග්‍රාහකයෝ වන්නේ අප ස්වාමීන්වහන්සේගේ සභාව තුල සිටින විටදීය. මන්ද දෙවියන්වහන්සේගේ සභාන රැස්වීම අත් නොහරින්නය කියා දේව වචනය පවසයි. *(හෙබ්‍රෙව් 10:25)* අද බොහෝ දෙනාට සභාවට පැමිණීම මහත් අමරුවූ කාර්‍යයක් වී තිබේ. 'අපට දුර වැඩියි. මහන්සියි. ප්‍රවාහන පහසුකම් ඇත, අමාරුයි' කියා විවිධ කාරණා පවසති. මේ අය දේව දරුවන් සමග එකතු වී නමස්කාර කිරීම හා යාච්ඤා කිරීම දෙවියන්වහන්සේගේ ආශිර්වාදය ලබා ගැනීම ආදී දේ නැතිකරනු ඇත. ඔබ ක්‍රිස්තුස්වහන්සේගේ සභාව සිටිනවා නම්, මේ ලෝකයේ කිසි දෙයකට ඔබව පරාජය කිරීමට නොහැකිය. ඔබ ජයග්‍රාහකයෙකු පමණි.

සභාවේ සාමාජිකයෙකුවී ශුද්ධවන්තයින් සමග සහභාගීකම් පවත්වන තැනැත්තන්ව මේ ලෝකයේ කිසිම බලවේගයකට පරාජය කිරීමකට බැරිය.

ඔබගේ ජීවිතයේ සියලු පරාජිත දේ ජයග්‍රාහණයට පවත්වනු ඇත. උන්වහන්සේ රටවල් වලට ආශිර්වාද කරනුයේ උන්වහන්සේගේ සභාව කරණකොටගෙනය. මේ සත්‍යතාව සමහර විට මිනිසුන්ට පිළිගැනීමට අසීරුය. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පිළිගත් අය මේ ලෝකයට අයිති සෙනඟක් නොවේ. සත්‍ය නම් මෙයයි. ඔවුන්ව ආරක්ෂා කරන්නේ ස්වර්ගයයි.

**(3). දෙවියන්වහන්සේගේ සභාවේ හිඳුවන ලද්දෝ සඵලවන්නෝය.**

*''ස්වාමීන්ගේ ගෘහයෙහි හිඳුවනලද්දෝ අපේ දෙවියන්වහන්සේගේ මිදුල්වල සඵලවන්නෝය.'' (ගීතාවලිය 92:13)*

කෘතිම පැලයක් පැලකර ඇති ස්ථානයන් ගලවා එය වෙනත් ස්ථානයක සිටුවීමට පුළුවනි. එයට වතුර දැමීමට අවශ්‍ය නැත. දෙවියන්වහන්සේගේ ගෘහයෙහි හිඳුවන ලද්දෝ තාවකාලික ලෙසත්, කෘතිම පැලයක් ලෙසත් නොවේය. ස්වභාවික පොළොවේ සිටුවා එයට වතුර දැමිය යුතුය. ඒ පැලය කරණකොටගෙන පලතුරු ලබා ගැනීමට හැකිය. දෙවියන්වහන්සේගේ දරුවන්ගේ ජීවිතයත් ඒ ආකාරය එය එය එලදරන්නාවූ ගසකට සමානය.

ඔවුන් උන්වහන්සේගේ සභාවෙන් සඵලවත් වන්නේය. සභාවේ පැලකරනු ලැබුවාවූ අය දෙවියන්වහන්සේගේ සභාව තුල මුල් අදිනු ලැබූ අය සඵලවත් හා එලදරන්නාවූ ජීවිතයක් ගතකරනු ලබති.

සභාව තුල සිටිමින් කැපවීමෙන් යුතුව සේවය කරමින් තමාගේ නායකයින් සමග සිටගන්නාවූ අය සඵලවත් වෙයි. අද බොහෝ දෙනා මේ ආකාර නොවන්නේය. සමහර අය වතුර බෞතීස්මය ලැබූ ගමන්ම ඔවුන්ගේ ගැලවීම සම්පූර්ණ යැයි සිතා පසුව ඔවුන් තනියම ගොස් ඔවුන්ගේම මාර්ග තුල ගමන් කර බොහෝ ක්‍රියා වලට තමාව යොමු කරති. අවසානයේදී ඔවුන්ට කිසිවක් නොමැති වේ. නමුත් ඔබ සභාව තුල සිටිමින් ඒ දර්ශනය තුල මුල් අදිමින් දෙවියන්වහන්සේගේ සභාව විසින් ඔබට දුන් වගකීම් හරියාකාරව ඉටු කරන්නේ නම්, ඔබ හැමවිටම සඵලවත් වේ. ඔබ කරන්නාවූ සෑමදේම සාර්ථක වේ. මා තරුණයෙක්ව සිටි කාලයේදී මගේ පාලකතුමාට මා උපකාර කරමින් නිතරම දේවස්ථානය අතුගෑවෙමි. මගේ සේවය වූයේ, එයයි. මේ කුඩා දේ මා ඉතා විශ්වාසවන්තව ඉටු කලෙමි. අද දෙවියන්වහන්සේගේ මා හට මහත් වූදේ කර තිබේ.

ඔබ දෙවියන්වහන්සේගේ සභාවේ හිඳුවන ලද්දාවූ පුද්ගලයෙක්ද? අද බොහෝ අය මේ ආකාරව නැත. ඔවුන් අද සභාවට අමුත්තන් පමණි. පොළොවෙහි ස්ථිරව සිටුවා ඇති ගසක් ඵලදරනු ඇත. අද බොහෝ කිතුණු ජීවිත වල ඵල රහිතය. අප ඇදහිලිවතුන්ය කියා පැවසුවද අපට ජයග්‍රහණයක් නැත. ඔබ කොතරම් දුරට දෙවියන්වහන්සේගේ සභාවේ දේ වලට හා වැඩ වලට ඔබව යොමුකර තිබේද? එපමන දුරට ඔබ ශක්තිවන්ත පුද්ගලයෙක්ය. ඒ නිසා ඔබ ඉතා හොඳ ඵලදරන්නාවූ කෙනෙක් වනු ඇත.

ස්වාධීනව සේවය කරන්නාවූ අය ගැන මිය ගියාවූ ජී. දේවදාසන් සුන්දරම් මෙසේ පැවසීය. ඔබ කැමතිවන ආකාරයට කොහේ හෝ ඔබට සේවය කිරීමට පුළුවනි. නමුත් ඔබගේ වස්ත්‍රයේ කොනක ලණුවක් බැද ඒ ලණුවේ අනෙක් කෙලවර සභාවක බැද තිබිය යුතුය. මන්ද ඔබේ සභාව කරණකොටගෙන ඔබට බලය ලැබෙන්නේය. ඔබට ස්ථිරවූ සභා නායකත්වයක් නැතිනම් ඔබගේ ආත්මික ජීවිතයේ ඔබ අනාථයෙක් වෙනු ඇත. මේ වචන කොපමණ සත්‍යතාවයක් තිබේද?

මෙය අප සියලුදෙනාටම අභියෝගයකි. මාද නායකත්වයක් යටතේ වැඩකරන නිසා අද දක්වා දෙවියන්වහන්සේ මට ආශිර්වාද කර තිබේ. මා මගේ නායකත්වය යටතේ සිටි නිසා එහි ආශිර්වාදය මා අද අත්දකිමි.

**(4). ප්‍රීතිමත් ස්වාමීන්වහන්සේගේ දවස**

***''නුඹ මාගේ ශුද්ධ දවසේදී නුඹේම කැමැත්ත නොකරන හැටියට නුඹේ පාද සබත් දවසේදී නවත්වාගන, සබත් දවස ප්‍රිය එකක්ය කියාද ස්වාමීන්වහන්සේගේ ශුද්ධ දවස ගෞරවණීය එකක්ය කියාද කියන්නෙහි නම්, නුඹේම මාර්ගවල නොහැසිර නුඹේම කැමැත්ත නොසොයා, හිස් වචන කථා නොකර, ඊට ගෞරවකරන්නෙහි නම්, නුඹ ස්වාමීන් වහන්සේ කෙරෙහි ප්‍රීතිමත්වන්නෙහිය, මමද පොළොවේ උසස්ථාන මතුයෙහි නැගීයන්ට නුඹට සලස්වා නුඹේ පියාවූ යාකෝබ්ගේ උරුමයෙන් නුඹ පෝෂණය කරන්නෙමි. මක්නිසාද ස්වාමීන්වහන්සේගේ මුඛය ඒක වදාළේය.''***
***(යෙසායා 58:13-14)***

අප සියලුදෙනාම ඉහළ ස්ථානයක සිටීමට කැමැතිය. අප සිටින්නාවූ තත්වයෙන් ඉහළ තත්වයකට සිටීමට අප කැමතිය. මෙය ලබාගන්නේ කෙසේද? මෙය ලබාගන්නේ එනම්, ස්වාමීන්වහන්සේගේ දවස වන ඉරුදින අප සියලුම දේ අත්හැර දෙවියන්වහන්සේ ප්‍රිය වෙන්නාවූ පරිදි ක්‍රියා කරමින් එය දෙවියන්වහන්සේගේ දවස කියා වෙන් කරමින් ඒ දවසෙහි ප්‍රීති වෙමින් ස්වාමීන්වහන්සේට අප ඒ දවස දිය යුතුය. මේ දවස අපට ප්‍රීතිමත් වූ දවසක්ය. ඒ දවස ඉතා යහපත්ය. එය අප දෙවියන්වහන්සේ සමරන්නාවූ දවසයි. අප ඒ දවසට ගරු කරමින් අනෙක් සියලුම දේ අත්හැර සභාවේ තිබෙන්නාවූ දේව මෙහෙයට මුල්තැන දෙමින්

*8 වෙනි පිටුවට...*


# ECHO OF HIS CALL

**Monthly magazines in 16 languages, Bible Colleges, Postal Courses, Church Planting, Village English High School, Gospel Printing Press, Crusades, Seminars, Social Services, etc.**

**Annual Subscription : Rs. 100/-** **Life Subscription : Rs. 2000/-**

The multifarious activities of **Echo of His Call Ministry** is supported by the free-will offerings and donations of the God's children like you. You may support **Echo of His Call** and its activities as the Lord leads you. We need your help to send forth the Gospel to the unreached people and plant Churches.

If you would like to receive **ECHO OF HIS CALL** magazines regularly, please write to us. Whenever you change your postal or e-mail addresses, please do inform us your old and new addresses.

**Echo of His Call** is available in 16 languages in our websites also. You can read it by going into the site as well as downloading it and get blessed.

Your letters, prayer requests and your financial helps (by D.D., Cheque, M.O. etc.) to **ECHO OF HIS CALL** may be sent to the address below.

Please send your **Land Phone / Cell Phone Numbers and E.mail addresses** for updation.



**REV. STEPHEN JOSEPH**

**133/53, Lourdes Lane, Teewatte Road, Ragama, Sri Lanka. Phone: 0112951123 Cell: 0777683307**

**E.mail : istephen@sltnet.lk / sam@echoofhiscall.org**

ඒ දේව අභිමුඛයේ දෙවියන්වහන්සේ තුල ප්‍රීතිවෙන්නේ නම්, ඔබගේ ජීවිතයේ දියුණුවක් සිදු වෙයි.

ඉරුදින දේව මෙහෙය අවසන් වී ඔබගේම ලෝකයේ ක්‍රියාවන් කිරීමටත් ලෝකයේ දේවල් වලින් ජීවිතයේ ප්‍රීතිය ලැබීමටත් ඔබ ක්‍රියා කරනවා නම් ඔබට ආශිර්වාදය ලැබෙන්නේ නැත. ඔබ දෙවියන්වහන්සේගේ දවස දෙවියන්වහන්සේටම කැපකල යුතුය. මන්ද එය දෙවියන්වහන්සේටම අයිතිය. එසේ නොමැති නම්, ඔබගේම තෘෂ්ණාවෙන් ඉටුකර ගැනීමට මේ දවසේදී ක්‍රියා කරනවා නම්, ඔබට ආශිර්වාදයක් නොමැති වේ.

ඔබ දෙවියන්වහන්සේගේ දවස ප්‍රීතිමත් දවසක් ලෙස සලකා එය ස්වාමීන්වහන්සේ උදෙසාම පාවිච්චි කරනවා නම්, ඔබගේ ජීවිතයේ ප්‍රීතිය ගලා යයි. ස්වාමීන්වහන්සේ ඔබව උසස් තැන්වල හිඳුවනු ලබයි. ඔබගේ ජීවිතයේ ආර්ථිකව, ශාරීරිකව හා ආත්මිකව බලවත් ආශිර්වාදයක් ඇතිවේ.

අද ඔබගේ ජීවිතයේ ආශිර්වාදයක් නොමැතිව මගේ ජීවිතයේ මෙලෙස තිබෙන්නේ ඇයි? කියා ඔබ අසනවා නම් ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබට කථා කරමින්, 'ස්වාමීන්වහන්සේගේ දවස තුල ප්‍රීතිමත් වෙන්න. ඒ දවස ස්වාමීන්වහන්සේ උදෙසා පමණක්ම පාවිච්චි කරන්න. එවිට දෙවියන්වහන්සේ ඔබව ඉහල ස්ථානයක තබන සේක.

## (5). මුලප්‍රමය ආශිර්වාදය

*''මාගේ ගෘහයෙහි භෝජන තිබෙන පිණිස නුඹලා ගබඩා ගෙට ඔතු සියල්ල ගෙනවුත්, මා විසින් නුඹලාට අහසේ කවුළු ඇර ඉඩම් මදිවෙන තරම් නුඹලාට ආශිර්වාදයක් වගුරුවා දෙන්නේ නැද්ද කියා එයින් මා සෝදිසිකර බලාපල්ලායි සේනාවල ස්වාමීන්වහන්සේ කියනසේක.'' (මලාකි 3:10)*

මට ලැබෙන්නාවූ ආදායමෙන් කොටසක් මා දෙවියන්වහන්සේට දුන්නොත් මට යහපත් වූ දේ සිදුවෙයිද කියා සමහරු අසති. ඔබට ලැබෙන්නාවූ සෑම දේ තුලින්ම දසයෙන් කොටස දෙවියන්වහන්සේට අයිතිය. ඔබට දෙවියන්වහන්සේගෙන් ලැබුණාවූ ආශිර්වාදයන් හා ඔබට ලැබුණාවූ සෑම දේ තුලින්ම දසයෙන් එක ස්වාමීන්වහන්සේට අයිතිය. එනම්, දෙවියන්වහන්සේට අයිති ඒ දසයෙන් කොටස ඔබ දිය යුත්තේ කොහාටද? එනම්, ඔබගේ ආත්මික ගබඩා කාමරය වන ඔබගේ සභාවට ඔබ එය දිය යුතුය. එසේ නොමැතිව. ඒ දසයෙන් කොටස ගෙන සඟරා සේවයට එසේ නොමැතිනම් මිෂනාරී සේවයට නැති නම් ඉවැන්ජලිස්ත සේවය සඳහා සමුලුවක් පැවැත්වීමටය කියා විවිධ දේ සඳහා දීමට නොහැකිය. මන්ද ඔබ දසයෙන් කොටස දිය යුත්තේ සභාවටය. ඔබ කුමන සභාවක සාමාජිකයෙක්ද ඔබ දසයෙන් කොටස දිය යුත්තේ ඒ සභාවටය. සභාවේ මුදල් රැගෙන දේව සේවයේ විවිධාකාර දේ වලට පාවිච්චි කිරීමට පුළුවනි. තවද ඔබ දෙන දසයෙන් කොටස

10 වෙනි පිටුවට...


**ඔබගේ කරුණාවන්ත අවධානය සඳහා**

**කැඳවීමේ ප්‍රතිරාවය** තුලින් සිදුවන විවිධාකාර සේවයන්, දෙවියන්වහන්සේගේ සේවයන් යයි ඔබ විශ්වාස කරනවාද?........................

කුමන ආකාරයකින් හෝ, **කැඳවීමේ ප්‍රතිරාවය** හි සේවයන්ට දායක වීමට ඔබ කැමති වන්නේද? ..........................................................................

ඔබගේ මහත් සැලකිලිවන්ත යාච්ඤා තුලින් මෙම සේවයන් ඉදිරියේ **යාච්ඤා හවුල්කරුවකු** වීමට ඔබත් කැමතිද?.............................

,**කැඳවීමේ ප්‍රතිරාවය**, සේවයන් හමුවේ, කුඩා මාසික දීමනාවකින් (මාස 12) ඇදහිල්ලේ පංගුකාරයකු වීමට, ඔබ අදහස් කරන්නේද?

..........................................................................................................................................

කරුණාකර අපට ලියන්න.

**ECHO OF HIS CALL,**
10, Mohammed Abdullah II Street, Chepauk, Chennai - 600 005, India.
Ph.: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766 Cell: (+91) 98410 71852.
**E-mail: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in Websites: www.echoofhiscall.org / www.echoofhiscall.com**



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

## ''...කියවන්නා තේරුම් ගනීවා....'' (මතෙව් 24:15)

***''මට භය ඇති කල්හි මට ඔබ කෙරෙහි විශ්වාසකරන්නෙමි.'' (ගීතාවලිය 126:5)***

***'' මාගේ විපත්ති දවසේදී ඔබට යාච්ඤා කරන්නෙමි. මක්නිසාද ඔබ මට උත්තර දෙනසේක.'' (ගීතාවලිය 86:7)***

11985 වන දවසේදී චේපාක් චේන්නෙයි වල කුඩා ස්ථානයක් කුලියට ගෙන ''යාච්ඤා හා උපදේශන මධ්‍යස්ථානය'' නමින් සේවයක් කිරීමට මා පටන් ගත්තෙමි. ආත්මික ලෙස උපදෙස් දීම අවශ්‍ය බව මගේ හදවතට හැඟුනු නිසා මේ කිතුණු නොවන පලාතක මා කුලියට ගත් ස්ථානයක මේ සේවය ආරම්භ කලෙමි. එම ගොඩනැගිල්ලේ ඉදිරිපස 'යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කැඳවීම ප්‍රතිරාවයේ යාච්ඤා හා උපදේශන මධ්‍යස්ථානය' යනුවෙන් සඳහන්ව ඇති පුවරුවක් සවිකලෙමි. සෑම දිනකම සමහර මිනිසුන් පැමිණ ඔවුන්ගේ ප්‍රශ්න හා කරදර මා හට පැවසූ අතර මා ඔවුන් උදෙසා යාච්ඤා කලෙමි. දෙවියන්වහන්සේ හාස්කම් කිරීමට පටන්ගත්තේය. ඉන්පසු බොහෝ අය ශුද්ධාත්මය වැහුනාවූ අයවද ගෙන ආවේය. අප යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් යාච්ඤා කල විටදී ඔවුන් බොහෝ දෙනෙක් නිදහස් විය.

වසරක් ගිය පසුව දෙවියන්වහන්සේ මෙසේ ක්‍රියා කිරීමට පටන්ගත් මේ ස්ථානයට විරුද්ධව බොහෝ විරුද්ධවාදීකම් පැමිණුනේය. මා දන්නාවූ අය පවා මේ සේවයට විරුද්ධව නැගී සිටයා. මට ලැබුණාවූ ආදායමෙන් ඉතා අමාරුවෙන් මේ ස්ථානයට මා කුලිය ගෙව්වෙමි. මෙම ස්ථානයට මා අත්තිකාරම් මුදලක්ද ගෙවා තිබුණි.

මට තිබූ ප්‍රශ්න නිසා මාස දෙකක කුලිය ගෙවීමට බැරිවූ නිසා එය අත්තිකාරම් මුදලෙන් අඩු කරන්නය කියා මා පැවසුවෙමි. නමුත් මට පැමිණි ප්‍රශ්න නිසා වහාම නිවසෙන් යන්නය කියා නිවෙස් හිමියා පැවසුවේය. එහි බොහෝ සෙනඟ ආත්මික සුවය පිණිස පැමිණි නිසා මා වෙනත් ස්ථානයක් සොයාගන්නා තුරු ටික කලක් දෙන්නය කියා පැවසූ නමුත් ඔහු ඉතා දැඩි ලෙස මට එයින් යන්නය කියා කරදර කලේය.

එසේ පවසා ඔහු මැරයන් දමා මා ළඟ තිබූ බඩු මුට්ටුද මග පාරට ඇද දැමුවේය. බොහෝ දෙනෙක් මේ ස්ථානයට පැමිණ මගේ බඩු බාහිරාදිය ඉවතට දමා තිබූ ආකාරය දැක හිනාවෙන්නට විය. මට උපකාර කිරීමට කිසිවෙක්ද පැමිණියේ නැත.

නමුත් ස්වාමීන්වහන්සේ මගේ හදවතට කථාකරමින් 'මගේ පුතා සෑම්, මෙය නුඹට අමාරු කාලයක් මුත් තනියම සිටගන්න. මා නුඹව කැඳවූ කැඳවීමට නිර්භීතව සිටින්න. මෙහි සිදුවන සෑම දේම මා දකිනවා. නුඹව කැඳවූ දෙවියන්වහන්සේ කවුද? කියා දැන ගන්නා පිණිස නුඹට දිනයක් උදාවේවි. නුඹට අද විරුද්ධව සිටින්නාවූ අය නුඹ කවුද කියා දැනගනිවී. අද නුඹ පහත් තත්වයේ සිටිනවා. නමුත් මම නුඹගේ ඇස් විවෘතකරන දා නුඹ දිකියි මා නුඹව තබා තිබෙන්නේ කොහේද කියා'' යනුවෙන් පවසනු ලැබුවේය.

පසුව මා මගේ බඩු මුට්ටු සියල්ලද කරත්තයක දමාගෙන නිවසේ අයිතිකාරයාගේ අවසරය ගෙන මා සිටි ඒ කුඩා ගොඩනැගිල්ලට ඇතුලු වී දණගසා ටික වේලාවක් යාච්ඤා කලෙමි. පිටත සිටි සෙනඟ සිතුවේ මා සිය දිවි නසා ගන්නවාය කියා. මා කුමක් කිරීමට යනවාද කියා ඔවුන් බලා සිටියෝය - මා ඉතා වේදනාවෙන් යාච්ඤා කරමින්, ''අනේ ස්වාමීනි, මගේ තත්වය දෙස දැන් බැලුව මැනව. මෙම ස්ථානයේ ඉතා සාර්ථකව මා කරගෙන ආ සේවය කුලී නොගෙවූ නිසාත් මිනිසුන්ගේ කරදර නිසාත් නතරකර යාමට සිදු වී තිබේ. අනේ ස්වාමීනි, ඔබ මාගේ තාත්තා නිසා අද මට විහිළු කරමින් හිනාවෙමින් සරදම් කරන්නන් ඉදිරියේ මටම කියා මේ පලාතේම ස්ථානයක් දුන මැනව. ඔබගේ මෙහෙකරුවා වන මා මේ සේවය දිගටම කරගෙන යන්න ඕනය'' කියා යාච්ඤා කලෙමි. පසුව නිවසේ යතුර අයිතිකාරයාට බාර දී මා යන්නට ගියෙමි. මගේ යාච්ඤාවට පිළිතුරක් ලැබුනේ නැත.

උන්වහන්සේ වසර තුනක් නිහඬවම සිටියේය. මේ වසර තුන තුළ මා බොහෝ අමාරුකම් තුල ගමන්කලෙමි. නමුත් සේවය අත්හැර නොගියෙමි. පසුව වසර තුනකට පසුව දෙවියන්වහන්සේ මගේ යාච්ඤාවට පිලිතුරු දුන්නේය. මා සිටින සථානයට වඩා අසූ ගුණයකින් විශාල පස් ගුණයක් උස ස්ථානයක් ඊළඟ වීදියේම දෙවියන්වහන්සේ මට දුන්නේය. මට සරදම්කල අයත් එම නිවසේ අයිතිකාරයනුත් දැන් මට ප්‍රශංසා කරයි. මාසේවය කරන්නාවූ දෙවියන්වහන්සේ සැබෑ බලවන්තවූ දෙවියන්වහන්සේයි. උන්වහන්සේ අදත් ජීවමානයි. අද ඔබගේ ජීවිතයේ බලවත්වූ හාස්කමක් කිරීමට පුළුවනි. ස්වාමින්වහන්සේට විශ්වාස කරන්න. ඔබගේ බලාපොරොත්තු නැතිකර ගන්න එපා.

***''තරුණ සිංහයෝ හිඟඇතිව සාගින්න විදිති. නුමුත් ස්වාමින් සොයන්නන්ට කිසි යහපත් දෙයකින් හිඟයක් නොවන්නේය'' (ගීතාවලිය 34:10)***

*8 වෙනි පිටුවෙන්...*

නිසියාකාරයෙන් දේව සේවය සඳහා පාවිච්චි කරන්නාවූ සභාවකට එය දිය යුතුය. එම නිසා ඇදහිලිවතුන්ට එය වෙනත් දේ සඳහා පාවිච්චි කිරීමට නොහැකිය. මෙය දෙවියන්වහන්සේ අපට නියෝගකලාවූ නියමයක්ය.

දෙවියන්වහන්සේ පවසන්නේ ඔබ දසයෙන් කොටස දී උන්වහන්සේව සෝදිසිකර බලන්නය කියාය. උන්වහන්සේ ස්වර්ග රාජ්‍යය විවෘතකර උන්වහන්සේ ඔබට ආශිරවාද කරනවාද නැද්ද කියා බලන්නය කියා පවසයි. මා මගේ ආදායමෙන් විශ්වාසවන්තව දසයෙන් එක ලබාදුන් නිසා දෙවියන්වහන්සේගේ ආශිර්වාදය මා අනන්තව අත්දැක තිබේ. අපට කුඩා ආදායමක් තිබෙන විට එයින් දසයෙන් එක අපට දීමට පුළුවනි. නමුත් අපගේ ආදායම වැඩිවන කල්හි අප එය විශ්වාසවන්තව දෙනවාද? රුපියල් දාහක් ලැබෙන විට රුපියල් සියයක් දෙන එක ඉතා පහසු නමුත් රුපියල් දස දහසක් ලැබෙන විට රුපියල් දාහක් දෙන එක අපට බොහෝ අසීරුය. දෙවියන්වහන්සේ අපට වැඩියෙන් දෙන විට අප දෙවියන්වහන්සේ විශ්වාසවන්තව වැඩියෙන් දිය යුතුය. ඔබ සිටින්නාවූ සභාවට ඔබ මේ දසයෙන් එක දෙන විට ඔබට ආර්ථික හා මූල්‍යමය පැත්තෙන් දෙවියන්වහන්සේ සිය ගුණයක් ආශිර්වාද කරනු ඇත. එබැවින් සභාවට යාමේ රහසද ඒ තුල දෙවියන්වහන්සේගේ ආශිර්වාදයේ රහසද දැනගෙන අපි ක්‍රියා කරමු.

**කරුණාකර අප ප්‍රධාන සභාවේ සේවාවන් උදෙසා යාච්ඤා කරන්න.**

1. යාච්ඤා සේවය - පැය 24 පුරා
2. බයිබල් තැපැල් පාඩම් මාලාව - ඉංග්‍රීසි, දෙමල හා හින්දි
3. කැඳවීමේ ප්‍රතිරාවය - මාසික සඟරාවන්
   දෙමල, ඉංග්‍රීසි, මලයාලම්, තෙලගු, හින්දි, මරාති, කන්නඩා, බෙංගාලි, ගුජරාති, ඔරියා, නේපාලි, අසාම්, පංජාබි, උර්දු, සිංහල සහ අප්‍රිකානාස්
4. නෙහෙමියා බයිබල් විදුහල
5. තැපැල් මාර්ගික බයිබල් පාඨමාලාව - දෙමල සහ ඉංග්‍රීසි
6. පුහුණුවීමේ වැඩසටහන්
7. චිත්‍රපටි සේවය සහ ශුභ ආරංචි රැස්වීම්
8. ශුභ ආරංචි පත්‍රිකා මුද්‍රණය කිරීම - ප්‍රකාශනය කිරීම.
9. මුද්‍රිත සේවය පවත්වාගෙන යාම.
10. ශාන්ත පාවුල් මෙට්‍රිකියුලේෂන් පාසල
11. සබත් පාසල - ඉරිදා පෙ.ව 8.30
12. දෙමළ භාෂාවෙන් දේව මෙහෙය - ඉරිදා පෙ.ව 5.00, 7.00 හා 10.00
13. තෙලෙගු භාෂාවෙන් දේව මෙහෙය - ඉරිදා ප.ව 4.00
14. හින්දි භාෂාවෙන් දේව මෙහෙය - ඉරිදා ප.ව 5.00
15. මලයාලම් භාෂාවෙන් දේව මෙහෙය- ඉරිදා ප.ව 5.00
16. ඉංග්‍රීසි සහ දෙමළ භාෂාවෙන් දේව මෙහෙය - ඉරිදා ප.ව 6.00
17. පත්‍රිකා බෙදා හැරීම. - ඉරිදා ප.ව 2.30
18. පාලක වරුන්ට උපදෙස් දීම. - ඉරිදා ප.ව 4.00
19. කාන්තා යාච්ඤාව - බදාදා ප.ව 5.30
20. සති මැද නමස්කාර දේව මෙහෙය
21. පුරුෂයින්ගේ යාච්ඤාව - සිකුරාදා ප.ව 8.00
22. සෙනසුරාදා දේව මෙහෙය - ප.ව 5.00
23. සේවකයින්ගේ රැස්වීම - සෙනසුරාදා ප.ව 6.00
24. ගෘහ රැස්වීම් - අඟහරුවාදා, බ්‍රහස්පතින්දා සහ සිකුරාදා ප.ව 6.30
25. විශේෂ රාත්‍රි භෝජනය - පළමු ඉරිදා උදෑසන 5.30
26. දෙමාපියන්ගේ යාච්ඤාව - පළමු ඉරිදා ප.ව 4.00
27 උපවාස යාච්ඤාව - පළමු සෙනසුරාදා පෙ.ව 9.30
28. සර්ව රාත්‍රි යාච්ඤාව - දෙවෙනි සිකුරාදා ප.ව 9.30
29. ශුද්ධවූ රාත්‍රි භෝජනය - දෙවන ඉරුදින දේව මෙහෙය
30. දිනපතා උදෑසන දේව මෙහෙය - පෙ. ව 5.00
31. කාර්යාල මණ්ඩලයේ මෙනෙහි කිරීම - දිනපතා පෙ.ව 9.00
32. කාර්යාල සේවය - දිනපතා පෙ.ව 9.00 සිට ප.ව 9.00

Regd. with the Registrar of Newspapers for India
under No. TN/SIH/2006/17846
Date of Publication: First week of every month
Date of Posting : 1st & 2nd of every month
Posted at "Egmore RMS / 1 Patrika Channel"
on 2nd MAY 2019
If un-delivered please return to:
ECHO OF HIS CALL (SINHALA)
P.O. Box No. 2957,
Chepauk, Chennai - 600 005, INDIA.
Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766

**JESUS LOVES YOU!**

To

*GOD BLESS YOU!*

Owned and published by **S. Sam Selva Raj** from Old No.18, New No. 10, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by him at **Echo of His Call Printers** Old No. 18, New No. 10, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**